නිපුණතාව 7.0 -

නිපුණතා මට්ටම 7.6

<u>චෙක්පත්</u>

- ජංගම ගිණුම් හිමියෙකු විසින් එහි සඳහන් මුදල නම සඳහන් පුද්ගලයාට හෝ රැගෙන එන අයෙකුට ගෙවන ලෙස බැංකුවට කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පත නම් වේ.
- චෙක්පතට සම්බන්ධ පාර්ශ්ව 3කි.
  1.අණකරු - ගිණුම්හිමියා
  2.අණලදු - ගිණුම පවත්වා ගෙන යන බැංකුව
  3.ආදායකයා - චෙක්පතේ මුදල ලැබීමට හිමිකම් ලබන්නා
- චෙක්පත් වර්ග දෙකකි.
  1.ධාරක චෙක්පත් - චෙක්පතේ " හෝ රැගෙන එන්නාට" යන පදය කපා නොහැර ඇති චෙක්පත්
  2.විධාන චෙක්පත් - " හෝ රැගෙන එන්නාට" යන පදය කපා හැර හෝ ඒ වෙනුවට " විධානයට" යන්න ලියා ඇති චෙක්පත්

<u>චෙක්පත් රේඛනය</u>

- චෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වානිජ බැංකුවක නමක් සඳහන් කිරීම.
- චෙක්පත් රේඛන වර්ග දෙකකි.
  1. සාමාන්‍ය රේඛනය - වගන්ති සහිතව හෝ රහිතව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම.
  2. විශේෂ රේඛනය - සරල සමාන්තර රේඛා දෙකක් සහිතව හෝ රහිතව චෙක්පතේ මුහුණත හරහා වානිජ බැංකුවක නමක් සඳහන් කිරීම.

<u>අභ්‍යාස</u>

1.චෙක්පත් රේඛනයේ අවශ්‍යතාව දක්වන්න.
2.චෙක්පතක් රේඛනයට බලය ඇති පාර්ශ්ව කවුරුන්ද?
3.චෙක්පතක් අගරු වන අවස්ථා දක්වන්න.